# අල්ගම ග්‍රාමයෙහි ඓතිහාසිකත්වය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

*ඉහළගම බුද්ධප්‍රිය* [1]

සබරගමු පළාතේ කෑගලු දිස්ත්‍රික්කයේ වරකාපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අල්ගම ග්‍රාමයෙහි පිහිටා තිබේ. කොළඹ නුවර මාර්ගයේ හොරගස්මංකඩ සිට ගොඩවෙල, තාඹුගල ආදී ග්‍රාම සේවා වසම් පසුකොට කි.මී 06 ක් පමණ ගිය තැන අල්ගම ග්‍රාමයට පිවිසිය හැකි ය. දැනට මහනුවර විෂ්ණු දේවාලයේ ඇති ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු විසින් ශක වර්ෂ 1631 දී ප්‍රකාශයට පත් කරන ලද රන් ආලේපිත සන්නසේත්, එච්. සී. පී බෙල් මහතා විසින් සම්පාදිත කෑගලු වාර්තාවේත් මෙම ප්‍රදේශය පිළිබඳව සඳහන් කොට තිබේ. මෙකී මූලාශ්‍රය පාදක කොටගෙන මෙම ග්‍රාමයෙහි ඓතිහාසිකත්වය පිළිබඳව ප්‍රමාණික දත්ත ක්‍රමානුකූල විකාශනයක් නොතිබීම මත ඇති වී තිබූ ගැටලුකාරී තත්වය සඳහා විධිමත් විසඳුමක් ලබා දීම මෙමගින් සිදුවේ. ඒ සඳහා සාහිත්‍ය විමර්ශන, ජනප්‍රවාද උපයෝගී කර ගැනුණි. සම්මුඛ සාකච්ඡා, ක්ෂේත්‍ර නිරීක්ෂණ වැනි ගුණාත්මක දත්ත වාර්තා කරන ක්‍රමවේද යොදා ගන්නා ලදී. දුරාතීතයේ සිට මෙම ප්‍රදේශයෙහි ඇල් සහල් වගා කර ඇති බවත්, එම සහල් දළදා තේවාව සඳහා රැගෙන ගොස් ඇති බවත්, ඇල් සහල් වගා කළ ගම ඇල්ගම වී පසුව අල්ගම වූ බවත් කියැවේ. තව ද ශක වර්ෂ 1631 දී ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු මහනුවර විෂ්ණු දේවාලය සඳහා සතර කෝරළයේ තත් ප්‍රදේශයෙන් සියලු ඉඩම්, වගාකෙත්, උස්බිම්, පහත්බිම්, වැව්, වගා නොකළ ඉඩම් මෙන්ම ඒවාට සේවා උපස්ථායකයන්ද ඇතුළුව ගම් දොළහක් ප්‍රධානය කළ බවට සාක්ෂ්‍ය දරයි. බෙලිගල් කෝරළයේ කීරවැලි පත්තුවේ (බටහිර) ප්‍රදේශයට අයත් මෙම ප්‍රදේශය තුළ අල්ගම (ඉහළගම) ටැම්පිට විහාරය, මැදගම පහළ විහාරය, දොරවක, ගණේගම රජමහා විහාරය, උඩුවක රජමහා විහාරය හා තාඹුගල ගල රජමහා විහාරය පිහිටා ඇත. එමෙන්ම මෙම ප්‍රදේශයට ආසන්නව පෞරාණිකත්වයෙන් යුත් කටාරම් සහිත ගල් ලෙන් කිහිපයක් ද දක්නට ඇති අතර බඹරගල කන්ද තුළ පිහිටි ගල්ලෙන් සංඛ්‍යාව දෙකකි.ඉන් එකක් 'පූජා ගල' ලෙස හැඳින් වේ. කස්තුරි කන්ද නම් ස්ථානයෙහි ද ගල් ලෙනක් දක්නට ලැබේ. බඹරගල ගලෙහි ඇටවූ ගල් උගුල් කිහිපයක් ද වන අතර ජනප්‍රවාදයේ එන මතයක් වනුයේ වළගම්බා රජු බඹරගල කන්දෙහි වනගතව වාසය කළ බව යි. එසේ ම මෙම ප්‍රදේශයේ උමං මාර්ග ඇති බවත්, අල්ගම ඇල්ල නම් ප්‍රදේශයේ පෘතුගීසීන් ලැගුම් ගෙන ඇති බවත් ජනප්‍රවාදයේ කියැවේ.සතර කෝරළේ අතපත්තුවේ ලේකම් පොත තුළ සඳහන් කීරවැලි පත්තුවේ හේවා නම් අතර 'අල්ගම හේවායා' නම් පුද්ගලයෙකු පිළිබඳ සඳහන් ය. ගම්පොළ යුගයේ රචිත තිසර සංදේශයෙහි තිසරා අල්ගමට පැමිණි බව හා එහි කාන්තාවන් පිළිබඳව සඳහන් කර තිබේ. දොරවක ප්‍රාග් ඓතිහාසික ස්ථානයට හා අලවල ප්‍රාග් ඓතිහාසික ස්ථානයට මධ්‍යගතව පිහිටි බැවින් මෙම ප්‍රදේශය ප්‍රාග් ඓතිහාසික වශයෙන් වැදගත් ප්‍රදේශයක් ලෙස හැඳින්විය හැකි අතර ආගමික, ආර්ථික, දේශපාලනික හා සංස්කෘතික වටිනාකමකින් යුත් ප්‍රදේශයක් වශයෙන් විද්‍යමාන ය.

***ප්‍රමුඛ පද:*** අතපත්තුවේ, අල්ගම, කෑගලු, සන්නස

---

[1] ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය. ihalagamabuddhapriya@gmail.com